සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2013**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

- ※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ 1 සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
- ※ එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

● අංක **1** සිට **15** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව :
   A - රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ විද්‍යාව ලෙස හැඳින්වේ.
   B - න්‍යායාත්මක දේශපාලනය හා ප්‍රායෝගික දේශපාලනය යන කොටස් දෙකෙන් සමන්විත වේ.
   C - සමාජීය විද්‍යා පවුලට අයත් විෂයයක් වේ.
   D - අතිශයින්ම පෞරාණික අධ්‍යයන විෂයයක් වන අතර ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ ක්‍රි.පූ. 4 වන සියවසේ දී ය.
   E - විද්‍යාත්මක ක්‍රම මගින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයයක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2. දේශපාලනය:
   A - දේශපාලන විද්‍යාවේ ප්‍රයෝගික පැත්ත වේ.
   B - බල අරගලය ක්‍රියාවට නංවන මාර්ගය වේ.
   C - සමාජ ප්‍රභූන් විසින් කරනු ලබන ක්‍රීඩාවක් වේ.
   D - අගය කිරීම් අධිකාරි බලය යොදාගෙන බෙදා හරින මාර්ගය වේ.
   E - කවුරුන් කුමක්, කෙලෙස, කුමන අවස්ථාවකදී ලබා ගන්නවාද යන්න තීරණය වීමේ ක්‍රියාදාමය වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

3. චර්යාවාදය:
   A - දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් 1940 ගණන්වලදී ඇමෙරිකාව තුළ ආරම්භ වූ අධ්‍යයන ව්‍යාපාරයක් වේ.
   B - දේශපාලන රඟුම්කරුවන්ගේ නිරීක්ෂණය කළ හැකි චර්යාව පමණක් අධ්‍යයනය කළ යුතු බව අවධාරණය කරනු ලැබී ය.
   C - මිනිසුන්ගේ සාර්ව දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම වර්ධනය කරනු ලැබී ය.
   D - න්‍යාය ගොඩනැගීමට සහ අධ්‍යයන විධික්‍රම වර්ධනය කිරීමට බෙහෙවින් දායක විය.
   E - ශිල්පීය උපක්‍රමවලට වඩා ප්‍රතිඵල පිළිබඳව වඩාත් සැලකිලිමත් විය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

4. රාජ්‍යය:
   A - නිශ්චිත දේශසීමාවන්ගෙන් වට වූ භූමියක් තුළ ජීවත් වන ජනතාව විසින් පිහිටුවා ගත් දේශපාලන සමාජය වේ.
   B - ග්‍රීක යුගයේ දී නාගරික රාජ්‍ය ලෙස ප්‍රථමයෙන් ආරම්භ විය.
   C - පොදු ආශාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වීම යන නාමය සහිත විශේෂිත දේශපාලන ආයතන පද්ධතියකින් සමන්විත වේ.
   D - නීති පැනවීමට සහ නීති කඩකරන අයට දඬුවම් කළ හැකි සුජාතභාවය සහිත අධිකාරි බලයෙන් යුක්ත වූවක් වේ.
   E - ලිබරල්වාදීන් විසින් පොදු සමාජ සංවිධානයක් ලෙස ද සමාජවාදීන් විසින් පංති ආයුධයක් ලෙස ද විග්‍රහ කර ඇත.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

5. ස්වාධිපතිත්වය:
   A - රාජ්‍යයන් පමණක් භුක්ති විඳින උසස්ම හා උත්තරීතර බලය වේ.
   B - අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වන බව විග්‍රහ කර ඇත.
   C - රාජ්‍යයේ වැදගත්ම සහ විශේෂිතම අංග ලක්ෂණය වේ.
   D - රාජ්‍යයේ ආත්මය වන අතර බලාධිකාරි බලය යෙදවීම සඳහා රාජ්‍යයට සුජාතභාවය සැපයෙන සාධකය වේ.
   E - ප්‍රබල රාජ්‍යයන් දුබල රාජ්‍යයන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා යොදා ගැනෙන නිර්ණායක අතුරින් එකක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

6. ආණ්ඩුව:
   A - දේශපාලන සමාජයේ පොදු කැමැත්ත නියෝජනය කරන රාජ්‍යයේ නියෝජිතයා වේ.
   B - තම කැමැත්ත ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යය විසින් භාවිතයට ගැනෙන උපකරණය වේ.
   C - ප්‍රජාතන්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍ර විරෝධී හෝ විය හැකි ය.
   D - එක් අයකුගෙන්, කිහිප දෙනකුගෙන් හෝ බොහෝ දෙනකුගෙන් සමන්විත විය හැකි ය.
   E - ප්‍රජාතන්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍රවාදී නොවන අයුරින් වෙනස් කිරීමට යටත් වූවක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[ දෙවෙනි පිටුව බලන්න.

7. සන්ධීය ආණ්ඩුක්‍රමය:
A - විවිධ මට්ටම් සහිත ආණ්ඩු අතර සිරස් ආකාරයට බලය හුවමාරු කර ගැනීමේ පදනම මත ගොඩනැගී ඇත.
B - බලතල බෙදීමේ තවත් ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.
C - විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයකට අනුගත කරවීම සඳහා ප්‍රයෝජනවත් වේ.
D - විවිධත්වය සමග ඒකීයත්වය බද්ධ කරන ක්‍රමයක් ලෙස විග්‍රහ කර ඇත.
E - සජාතීය සමාජ ක්‍රම සහිත රටවල් සඳහා වඩාත් යෝග්‍ය වන බව පිළිගනු ලැබේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

8. ඒකීය ආණ්ඩුක්‍රමය:
A - එක් බල මධ්‍යස්ථානයක් පදනම් කොට ගෙන ගොඩනැගී ඇත.
B - ජාතික දේශපාලනය පදනම් කරගෙන ජාතික ඒකාග්‍රතාව වර්ධනය කිරීමට ඉවහල් වේ.
C - ඒකීය අධිකරණ ක්‍රමයක් හා පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යාමට ප්‍රයෝජනවත් වේ.
D - ප්‍රාදේශීය සම්පත් ජාතික ප්‍රතිපත්ති හරහා සමාන අයුරින් ප්‍රයෝජනයට ගැනීමට උපකාරී වේ.
E - බහුවිධ සමාජ ක්‍රම සහිත විශාල රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

9. කැබිනට් ආණ්ඩුක්‍රමය:
A - නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වෙන ද්විත්ව විධායකයකින් යුක්ත වේ.
B - වැඩි කාර්යක්ෂමතාවයකින් සහ අඩු ප්‍රජාතන්ත්‍රවාදී භාවයකින් යුක්ත වේ.
C - නාමික විධායකය නායකත්වය දරන අතර එමගින් සත්‍ය විධායකය පත් කරනු ලැබේ.
D - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටින නිසා වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
E - රාජ්‍යයේ නායකයා සහ ආණ්ඩුවේ නායකයා එකිනෙකින් වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. ජනාධිපති ආණ්ඩුක්‍රමය:
A - ජනාධිපති නමින් හඳුන්වන ඒකීය විධායකයක් විසින් නායකත්වය දරනු ලැබේ.
B - සෘජුව තෝරාපත් කරන විධායකයකින් හා ව්‍යවස්ථාදායකයකින් සමන්විත වේ.
C - විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවතින දුරස්තර සම්බන්ධතාව විශේෂ ලක්ෂණය වේ.
D - ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු සහ කාර්යක්ෂමතාවයෙන් වැඩි වේ.
E - දේශපාලන හා ආර්ථික වශයෙන් පසුගාමී රටවල්වලට වඩාත් සුදුසු වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් වන්නේ:
A - රාජ්‍යය විසින් පාලනය කරන ආර්ථිකය
B - අධිකරණයේ ස්වාධීනත්වය සහිත නීතියේ ආධිපත්‍යය පදනම් කරගත් ව්‍යවස්ථානුකූල ආණ්ඩුව
C - සහතික කරන ලද සිවිල් නිදහස, පුද්ගල අයිතිවාසිකම් සහ ජනමාධ්‍ය නිදහස
D - දේශපාලන බහුවිධතාව පිළිගත් සහ සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන කාලීනව පවත්වන මැතිවරණ
E - සංවිධානය වූ කණ්ඩායම් ක්‍රියාකාරිත්වයට හා විවිධ ආශාවන්ට නිදහස සහිත ශක්තිමත් සිවිල් සමාජය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

12. ඒකතන්ත්‍ර පාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - තනි පුද්ගලයකු අත ඒකරාශි කරන ලද අසහාය බලය
B - පාලකයා නීතියට ඉහළින්ම සිටීම හා ව්‍යවස්ථානුකූල සීමාවන්ගෙන් තොරවීම
C - එක් පක්ෂයක අසහාය නායකත්වය සහිත තරහකාරී පක්ෂ ක්‍රමය
D - හිතුවක්කාරී ලෙස සංවරණයකින් තොරව රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
E - සමාජීය හා පෞද්ගලික පැවැත්මේ සෑම පැතිකඩක්ම වසා පැතිරුණු දේශපාලන වශයෙන් කෙරෙන පාලනය කිරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. ධනවාදය පදනම් කරගත් ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - වෙළෙඳපොළ බලවේග අනුව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
B - නිෂ්පාදන ප්‍රාග්ධනයේ පෞද්ගලික හිමිකම
C - උපයෝගිතා වටිනාකම අනුව නොව වෙළෙඳපොළ වටිනාකම අනුව භාණ්ඩ හා සේවාවන්හි මිල නියම වීම
D - වෙළෙඳපොළ බලවේග පාලනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යය පූර්ණ ලෙස මැදිහත් නොවීම
E - ද්‍රව්‍යාත්මක ආශාවන් හා ලාභය උපරිම කිරීම යන බලවේග මගින් මෙහෙයවන ක්‍රමයක් වීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. සමාජවාදී දේශපාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - ධනයේ සාමූහික හිමිකම
B - නිර්ධන පංතියේ ආඥාදායකත්වය
C - පංති විරහිත සමාජක්‍රමය
D - මානව තෘප්තිය සහ පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
E - ඒකපක්ෂ නායකත්වය සහිත ආණ්ඩුව
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. නීතිය:
A - අණදීම්, තහනම් කිරීම් සහ හිමිකම් දක්වෙන විධිවිධාන පද්ධතියක් වේ.
B - ආණ්ඩුව විසින් සාදනු ලබන සමස්ත සමාජය පුරා ක්‍රියාත්මක වන්නක් වේ.
C - රාජ්‍යයේ කැමැත්ත ප්‍රකාශ කරන මාධ්‍යය වේ.
D - අවනතභාවය ලබා ගන්නේ පොලිස් පහරදීම්වලට මිනිසුන් තුළ ඇති බිය හරහා ය.
E - පිළිපැදීම අනිවාර්ය වන අතර යටත්වීම තේරීමකට ලක්කිරීමට පුරවැසියන්ට හිමිකම නැත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[ තුන්වෙනි පිටුව බලන්න.

● අංක **16** සිට **25** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට **අදාළ නොවන** ප්‍රකාශය තෝරන්න.

16. මානව අයිතිවාසිකම්:
 (1) මිනිසෙක් වීම නිසාම මිනිසාට හිමිවන්නාවූ අයිතිවාසිකම් වේ.
 (2) සෑම මිනිසකුටම හිමිවන බැවින් විශ්වීය ස්වරූපයක් ගනී.
 (3) අහිමි කිරීමට, පවරාදීමට හා ආපසු ගැනීමට නොහැකි බැවින් මූලික අයිතිවාසිකම් බවට පත් වේ.
 (4) මානවයන්ගේ ආත්ම ගරුත්වයට සහ පැවැත්මට අවශ්‍ය වේ.
 (5) නීතියෙන් හිමිකම් කිවහැකි අයිතිවාසිකම් පමණක් වේ.

17. දේපල:
 (1) 'ස්වයං හිමිකම' පදනම් කර ගත් අයිතියක් වේ.
 (2) ආර්ථික අභිවෘද්ධිය හා කාර්යක්ෂමතාව ඇති කිරීම පිණිස ශ්‍රමය දිරි ගන්වන උත්තේජකයක් ලෙස සැලකේ.
 (3) පුද්ගල නිදහස, ස්වාධීනත්වය හා ස්වපැවැත්ම ශක්තිමත් කරන වැදගත් සාධකයක් ලෙස සැලකේ.
 (4) සමාජ අගයකිරීම් වර්ධනය කිරීම සඳහා දයක වන්නා වූ වැදගත් මූලාශ්‍රයක් වේ.
 (5) පුද්ගලයින්ගේ සමාජ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යම සාධකයක් ලෙස සමාජවාදීන් විසින් ද පිළිගෙන තිබේ.

18. දේශපාලන නියෝජනය:
 (1) පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් පුළුල් ජන සමූහයක් වෙනුවෙන් පෙනී සිටින හෝ ක්‍රියා කරන ආකාරය පෙන්නුම් කරන සම්බන්ධතා විධික්‍රමය වේ.
 (2) නියෝජන ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නංවන පදනම් මූලධර්මය වේ.
 (3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ ආණ්ඩුව හා ජනතාව යා කරන මාධ්‍යය වේ.
 (4) 'තනි ඡන්දය-අසමාන අගය කිරීම' යන පදනම යටතේ ක්‍රියාත්මක වේ.
 (5) නූතන තත්ත්වයන් යටතේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි එකම ක්‍රමය ලෙස සැලකේ.

19. පුරවැසියා:
 (1) රාජ්‍යයේ පිළිගැනීම සහිත දේශපාලන සමාජයක සාමාජිකයකු ලෙස අර්ථකථනය කර ඇත.
 (2) රාජ්‍යය මගින් ප්‍රදානය කරන විශේෂිත අයිතිවාසිකම් හා බැඳීම් සමූහයක් සහිත අයකු වේ.
 (3) විදේශිකයින් යන යෙදුම සමග සමපාත වේ.
 (4) උපතින් හෝ ලියාපදිංචි වීමෙන් හිමි වේ.
 (5) ඡන්ද බලය දීමට සහ සමහර රාජ්‍ය තනතුරු පිරිනැමීමට යොදා ගැනෙන එකම නිර්ණායකය වේ.

20. සිවිල් සමාජය:
 (1) රාජ්‍යයේ පාලනයෙන් මුළුමනින්ම වියුක්ත වූ සමාජය වේ.
 (2) රාජ්‍යය සහ පවුල යන සංවිධානවලට පරිබාහිර වශයෙන් ගොඩනගා ඇති මධ්‍යස්ථ සංවිධානවලින් සමන්විත සමාජය වේ.
 (3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හොඳින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍යම සාධකයක් ලෙස සැලකේ.
 (4) ආණ්ඩුවේ බලය පාලනය කිරීම සඳහා යෙදවිය හැකි වැදගත් සංරෝධකයක් ලෙස සැලකේ.
 (5) ජනතාව දේශපාලන හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා යොදාගත හැකි උපකරණයක් ලෙස සැලකේ.

21. ඇමෙරිකා එක්සත් ජනපදයේ දේශපාලන ක්‍රමය:
 (1) 1789 දී ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වී ඇත.
 (2) ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සමන්විත සන්ධීය රාජ්‍යයක් වේ.
 (3) ජනතාව විසින් සෘජුව තෝරාපත් කරන ජනාධිපතිවරයකු නායකත්වය දරනු ලැබේ.
 (4) සම්භාව්‍ය සන්ධීය මූලධර්ම මත ගොඩනැගුණු සන්ධීය ක්‍රමයක් වේ.
 (5) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර බල හවුල්කාරිත්වය පදනම් කරගෙන ගොඩනැගුණු එකක් වේ.

22. මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව:
 (1) නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති බලය දරන අතර එම හේතුවෙන් ඕනෑම නීතියක් සෑදීමට හෝ අවලංගු කිරීමට බලය තිබේ.
 (2) ද්වි මාණ්ඩලික වන අතර එයින් බලවත්ම ආයතනය මහජන මන්ත්‍රී මණ්ඩලය වේ.
 (3) විශ්වාස භංග යෝජනාවක් මගින් දේශපාලන විධායකය ඉවත් කිරීමේ හැකියාව භුක්ති විඳිනු ලැබේ.
 (4) දේශපාලන විධායකය තෝරාපත් කරන මූලාශ්‍රය වේ.
 (5) නාමික විධායකය විසින් ස්වකීය අභිමතානුසාරී බලය යොදවා විසුරුවා හැරීමට යටත් වේ.

23. 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව:
 (1) ඩිගෝල් ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඉතාමත්ම වැදගත් නවාංගය ලෙස සැලකේ.
 (2) සමන්විත වන්නේ නිල බලයෙන් පවත්වන හා නාමකරණයෙන් පත් කරන යන සමාජික වර්ග දෙකෙනි.
 (3) විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා හා ආරක්ෂා කිරීමේ භාරකරුවා වේ.
 (4) ජනාධිපතිවරණ හා ජනමතවිචාරණ අධීක්ෂණය කරන්නා වේ.
 (5) ජනාධිපතිවරයාට එරෙහිව ගෙනෙන දෝෂාභියෝග විනිශ්චය කරන්නා වේ.

24. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය:
 (1) 1950 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇත.
 (2) අග්‍ර විනිශ්චයකරු හා තවත් විනිශ්චයකරුවන් 25කින් සමන්විත වේ.
 (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා සහ මූලික අයිතිවාසිකම්වල භාරකරුවා ලෙස ක්‍රියා කිරීමේ බලය භුක්ති විඳී.
 (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ බලයෙන් තොර වේ.
 (5) සතුවන බලතල හා කාර්යයන් අනුව ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයට බෙහෙවින් සමාන වේ.

25. ස්විට්සර්ලන්තයේ ෆෙඩරල් ව්‍යවස්ථාදායකය:
 (1) ඒක මණ්ඩල වේ.
 (2) ජනතා බලයට යටත්ව රාජ්‍ය බලය ක්‍රියාවට නංවන උත්තරීතර උපකරණය වේ.
 (3) සෑම ආකාරයකම ෆෙඩරල් නීති පැනවීමේ බලය භුක්ති විඳී.
 (4) ෆෙඩරල් විධායකය, ෆෙඩරල් විනිශ්චයකරුවන්, වෙනත් උසස් රාජ්‍ය නිලධාරීන් සහ හමුදාපති පත්කිරීමේ බලය භුක්ති විඳී.
 (5) සෑම ෆෙඩරල් බලධාරී ආයතනයක්ම අධීක්ෂණය කිරීමේ බලය දරන්නා ද වේ.

[ හතරවෙනි පිටුව බලන්න.

59112

● අංක 26 සිට 32 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහෙන් මාතෘකාවට අදළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

26. 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින්:
A - සීමිත ඡන්ද බලය ප්‍රදනය කිරීමට යෝජනා කරන ලදී.
B - ආණ්ඩුකාරයාගේ තනි මතය අනුව පාලනය කිරීමේ බලය දුර්වල කරන ලදී.
C - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ආරම්භක පදනම දමන ලදී.
D - ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදයක සභා පිහිටුවන ලදී.
E - ආණ්ඩුක්‍රමය එක්සේසත් කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින්:
A - ධනවාදී ආර්ථිකයේ වර්ධනය සඳහා පදනම දමන ලදී.
B - එක්සත් රාජ්‍යයක් නිර්මාණය කිරීම සඳහා පදනම දමන ලදී.
C - ස්වාධීන අධිකරණ හා පරිපාලන ක්‍රමයන්හි වර්ධනය සඳහා පදනම දමන ලදී.
D - නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් වර්ධනය කිරීම සඳහා දයකත්වය සැපයුණි.
E - උඩරට ප්‍රදේශයේ මිෂනාරි වැඩකටයුතු තහනම් කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

28. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාව තුළ වාණිජ වතු වගාව වර්ධනය වීම කෙරෙහි දයකවූ සාධක වන්නේ:
A - යටත්විජිත ආණ්ඩුව විසින් ප්‍රචාරය කළ ලෞකිකවාදී අදහස්
B - විදේශ බැංකු විසින් සැපයූ ආයෝජන ප්‍රාග්ධනය
C - ඉන්දියානු ශ්‍රමිකයින්ගේ ලාභ ශ්‍රමය
D - උඩරට ජනතාවගෙන් අත්කර ගත් ඉඩම්
E - බ්‍රිතාන්‍ය වතු වගාකරුවන් සැපයූ ව්‍යවසාය නායකත්වය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

29. 1911 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින්:
A - ව්‍යවස්ථාදයක සභාවේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩි කළේ ය.
B - ප්‍රථම වරට නියෝජන මූලධර්මය හඳුන්වා දුන්නේ ය.
C - ආණ්ඩුකරුගේ බලතල පුළුල් ලෙස කප්පාදු කළේ ය.
D - වාර්ගික නියෝජනය එසේම පවත්වා ගෙන ගියේ ය.
E - ඡන්දයෙන් එක් නියෝජිතයකු තෝරාපත් කිරීමට ස්වදේශිකයන්ට බලය දුන්නේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණ වන්නේ:
A - වාර්ගික නියෝජනය සීමා කිරීම
B - ව්‍යවස්ථාදයක සභාවේ සාමාජික සංඛ්‍යාව 49 දක්වා වැඩි කිරීම
C - ව්‍යවස්ථාදයක සභාව තුළ ප්‍රථම වරට ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරුන් බහුතරය බවට පත් කිරීම
D - මුදල් කාරක සභාවේ බලතල හා කාර්යයන් ශක්තිමත් කිරීම
E - බලය සහ වගකීම වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් ගොඩනැගීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

31. ලංකාවේ ජාතික ව්‍යාපාරය:
A - ආසියාව තුළ තිබූ වඩාත්ම සාමකාමී ජාතික විමුක්ති ව්‍යාපාරය විය.
B - බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් ආරම්භ කළ සහ මෙහෙය වූ ව්‍යාපාරයක් විය.
C - ප්‍රධාන වශයෙන් ඉල්ලා සිටියේ අභ්‍යන්තර ස්වයං පාලන ක්‍රමයක් ය.
D - ජනතාවාදී ව්‍යාපාරයක් නොවීය.
E - ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින් සමාන විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

32. 1930 ගණන්වලදී ලංකාව තුළ වාමාංශික ව්‍යාපාරය ආරම්භවීම කෙරෙහි බලපෑ හේතු සාධක වන්නේ:
A - 1930 ගණන්වලදී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය
B - 1930 ගණන්වල ආරම්භ වූ ආගමික පුනරුද ව්‍යාපාරය හා අමද්‍යප ව්‍යාපාරය
C - 1930 ගණන්වලදී පැන නැගුණ සංවිධානාත්මක රැඩිකල් කම්කරු ව්‍යාපාරය
D - නිදහස දිනා ගැනීම සඳහා ලංකා ජාතික සංගමය අනුගමනය කළ දියාරු සහ පෞරාණිකවාදී ක්‍රියා පිළිවෙත
E - මාක්ස්වාදයට නැඹුරු වූ බටහිර අධ්‍යාපනය ලැබූ රැඩිකල් තරුණ කණ්ඩායමක් බිහිවීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක 33 සිට 36 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට **අදළ නොවන** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

33. 1931 දී ක්‍රියාවට නැංවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වන්නේ:
A - කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය ලෙස ය.
B - මැනිං ප්‍රතිසංස්කරණය ලෙස ය.
C - මැනිං-ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය ලෙස ය.
D - ඩොනමෝර් ප්‍රතිසංස්කරණය ලෙස ය.
E - සෝල්බරි ප්‍රතිසංස්කරණය ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[ පස්වෙනි පිටුව බලන්න.

34. 1931 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ:
A - පාර්ලිමේන්තුව ලෙස ය.
B - කොන්ග්‍රසය ලෙස ය.
C - අධිරාජ්‍ය සභාව ලෙස ය.
D - ජාතික සභාව ලෙස ය.
E - රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

35. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හා සම්බන්ධව 'මුර බල්ලන්' යන පදය යෙදුවේ:
A - ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
B - රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
C - ආණ්ඩුකාරයා, යටත්විජිත ලේකම් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
D - අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් හැඳින්වීම සඳහා ය.
E - අමාත්‍ය මණ්ඩලයේ ස්වදේශික සාමාජිකයින් හැඳින්වීම සඳහා ය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

36. ඩොනමෝර් ව්‍යවස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහිකව වගකිව යුතු වූයේ:
A - යුද්ධ කටයුතු සඳහා කෙරෙන වියදම් වෙනුවෙන් පමණි.
B - වාර්ෂික අයවැය ලේඛනය වෙනුවෙන් පමණි.
C - අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලුම විධායක තීරණ වෙනුවෙනි.
D - ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනා හා සම්බන්ධ වියදම් වෙනුවෙන් පමණි.
E - අමාත්‍ය මණ්ඩලය නඩත්තු කිරීම සඳහා වැය වන වියදම් වෙනුවෙන් පමණි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **37** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ පහ අතුරින් ඒ ඒ මාතෘකාවට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

37. 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය:
A - බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කළේ ය.
B - බ්‍රිතාන්‍ය කිරීටය ලංකාවේ රාජ්‍ය නායකයා බවට පත් කළේ ය.
C - බ්‍රිතාන්‍ය ක්‍රමයට අනුරූපවූ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පිහිටුවීය.
D - නීති නිර්මාණය කිරීම සඳහා සීමිත බලයක් සහිත ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කළේ ය.
E - අවසාන අභියාචනාධිකරණ බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණයක නායකත්වය සහිත අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

38. 1948 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වුණු ද්විත්ව විධායකය
B - ඉහළ හා පහළ යනුවෙන් හැඳින්වුණු මණ්ඩල දෙකකින් යුත් ව්‍යවස්ථාදායකය
C - එංගලන්තයේ රාජාධිකරණයට අවසාන අභියාචනාධිකරණ බලය පැවරුණු අධිකරණ පද්ධතිය
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂයෙන් දක්වන ලද ව්‍යවස්ථා ආවරණ පද්ධතිය
E - දේශපාලනය විධායකය මගින් පාලනය කළ ස්වාධීන නොවූ රාජ්‍ය සේවාව
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

39. 1948 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය:
A - කැබිනට් මණ්ඩලය යන නිල නාමයෙන් හැඳින්විණ.
B - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතුරින් නාමික විධායකය විසින් පත් කරනු ලැබී ය.
C - අගමැතිවරයා නායකත්වය දරණු ලැබී ය.
D - ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකිව යුතු විය.
E - ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරන ලද දෝෂාභියෝග යෝජනාවකින් නිලයෙන් පහකළ හැකි විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

40. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ආණ්ඩුක්‍රමයේ විශේෂිත ලක්ෂණ කිහිපයක් වන්නේ:
A - සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත් කිරීම
B - නාමික විධායකය විසින් සත්‍ය විධායකය පත් කිරීම
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය පදනම් කරගෙන පිහිට වූ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය
D - නීති විවරණය කිරීමේ බලය සහිත අභියාචනාධිකරණයක නායකත්වයෙන් යුත් අධිකරණ ක්‍රමය
E - දේශපාලන විධායකයේ සෘජු පාලනයට යටත් කරන ලද රාජ්‍ය සේවය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

41. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය:
A - ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්විණ.
B - ඡන්දයෙන් තෝරන ලද හා නාමකරණයෙන් පත් කරන ලද වශයෙන් මන්ත්‍රීවරුන් දෙවර්ගයකින් සමන්විත විය.
C - 'රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය' ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැඳින්විණ.
D - ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ක්ෂේත්‍ර තුනේම බලතල ක්‍රියාවට නැංවීමේ බලය භුක්ති වින්දේ ය.
E - අඩුම වශයෙන් වසරකට වරක්වත් රැස්විය යුතු විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[ හයවෙනි පිටුව බලන්න.

42. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයට හඳුන්වා දුන් වෙනස්කම් කිහිපයක් වන්නේ:
A - ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම
B - ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස නම් කිරීම
C - ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපති බලය ජනතාව අතට පත්කිරීම හා එය අත් හැරිය නොහැකි බව දැක්වීම
D - පූර්ව අධිකරණ විනිශ්චය බලය සහිත ව්‍යවස්ථානුකූල අධිකරණයක් හඳුන්වා දීම
E - අධිකරණ විනිශ්චය බලය සහිත මූලික අයිතිවාසිකම් මාලාවක් පුරවැසියන්ට ප්‍රදානය කිරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

43. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
A - නිදහස ලැබූ දිනයේ සිට ශ්‍රී ලංකාව තුළ පැවති මූලික ව්‍යවස්ථානුකූල රාමුව වෙනස් කළේ ය.
B - රාජ්‍ය-ධනවාදි සාම්ප්‍රදායික ආර්ථික සංවර්ධන මොඩියුලය අත්හැර දැමුවේ ය.
C - 1833 වර්ෂයේ සිට වර්ධනය වූ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතිය අවප්‍රමාණය කළේ ය.
D - රාජ්‍යයේ ඒකීයභාවය වෙනස් කළේ ය.
E - පුද්ගලවාදය පදනම් කරගත් දේශපාලනය බල ගැන්වී ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති:
A - ඕනෑම වාර ගණනක් තනතුර දැරිය හැකි ය.
B - සංවරණයකින් තොරව පුළුල් ප්‍රමාණයක විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල දරනු ලැබේ.
C - කරන කාර්යයන් විශේෂ යෝජනාවකින් තොරව පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කිරීමට යටත් වේ.
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ම නීතියට ඉහළින් තබා ඇත.
E - සාමාන්‍යයෙන් හඳුන්වන්නේ ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

45. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකය:
A - පාර්ලිමේන්තුව ලෙස හැඳින්වේ.
B - තෝරා පත්කරන හා නාමකරණයෙන් පත්කරන වශයෙන් මන්ත්‍රීවරුන් දෙවර්ගයකින් සමන්විත වේ.
C - නීති පැනවීම පිළිබඳව සර්වාධිපති ආයතනයක් නොවේ.
D - සැසිවාර පැවැත්වීම සඳහා අවම වශයෙන් මන්ත්‍රීවරුන් 30ක් සභාගැබ තුළ සිටිය යුතු ය.
E - ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝග ගෙන ඒමේ බලය භුක්ති විඳී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

46. පළාත් සභා:
A - 1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පිහිටුවන ලදී.
B - මූලික නීතියේ කොටසක් බවට ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය යටතේ පත්විය.
C - පළාත් සභා ලැයිස්තුවේ අන්තර්ගත කරුණු සඳහා ප්‍රඥප්ති සෑදිය හැකි ය.
D - සමගාමී ලැයිස්තුවේ අන්තර්ගත කරුණු සඳහා තනිව ප්‍රඥප්ති සෑදිය නොහැකි ය.
E - ස්වාධිපති ආයතන නොවේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

47. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන:
A - මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යනුවෙන් ප්‍රභේද තුනක් වේ.
B - ක්‍රියාත්මක විය යුත්තේ මධ්‍යම ආණ්ඩුවේ අධීක්ෂණයට යටත්ව ය.
C - තමන්ගේ බල ප්‍රදේශය තුළ සමාජ ප්‍රයෝජ්‍යතා සේවාවන් සැපයීමේ වගකීම පැවරී ඇත.
D - සමන්විත වන්නේ වසර තුනක නිල කාලයක් සඳහා ඡන්දයෙන් තෝරන ලද නියෝජිතයන්ගෙන් පමණි.
E - මධ්‍යම ආණ්ඩුවෙන් අවධාරිත කරන ලද බලය පදනම් කොට ගෙන ක්‍රියාත්මක විය යුතු බැවින් ස්වාධීන ආයතන නොවේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

48. එක්සත් ජාතීන්ගේ සංවිධානය:
A - වර්තමාන ලෝකය තුළ තිබෙන පුළුල් අරමුණු සහිත විශාලතම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.
B - 1945 සැන් ප්‍රැන්සිස්කෝ සම්මේලනයේදී ජාතීන් 50ක් විසින් අත්සන් කරන ලද ප්‍රඥප්තිය මත ගොඩනගා ඇත.
C - සාමාජික රාජ්‍යයන්ගේ සමාන ස්වෛරීභාවය පිළිගැනීමේ මූලධර්මය මත ක්‍රියාත්මක වේ.
D - සාමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමට ප්‍රඥප්තියෙන් බලය පවරා ඇත.
E - වර්තමාන ලෝකය තුළ අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතභාවය පිළිබඳව ක්‍රියාකරන ප්‍රධානම අන්තර්ජාතික සංවිධානය වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

49. කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය:
A - පුළුල් අරමුණු සහිත කලාපීය සංවිධානයක් වේ.
B - සමන්විත වන්නේ දකුණු ආසියාතික රාජ්‍යයන් අටකිනි.
C - ක්‍රියාත්මක වන්නේ භූ-දේශපාලන ක්ෂේත්‍රයන්හි සාමාජිකයින් අතර සහයෝගය වර්ධනය කිරීම සඳහා ය.
D - 1985 දෙසැම්බර් 8 වෙනිදා ප්‍රකාශයට පත් කළ 'ඩකා ප්‍රකාශනය' පදනම් කරගෙන ගොඩනගා ඇත.
E - අන්තර්ජාතික සමාජයේ හඳුන්වන්නේ 'දුප්පතුන්ගේ සමාජය' ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

50. පොදු රාජ්‍ය මණ්ඩලය:
A - සීමිත අරමුණු සහිත මධ්‍යම ප්‍රමාණයේ රාජ්‍ය නොවන සංවිධානයක් වේ.
B - සමන්විත වන්නේ ප්‍රධාන වශයෙන්ම කලින් බ්‍රිතාන්‍ය යටත් විජිත ලෙස පැවැති රටවල් වලිනි.
C - සැලකිලිමත් වන්නේ සාමාජික රාජ්‍යයන්හි ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි ය.
D - බ්‍රිතාන්‍ය රජිනගේ නායකත්වය යටතේ පවතී
E - සංවිධානය කර ඇත්තේ 1950 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාව යටතේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය: ....................................

| A කොටස | |
|---|---|
| මුළු ලකුණු | 20 |

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.
* A කොටස තුළ කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු 01 ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු 1/2 ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

1. (i) 'දේශපාලන විද්‍යාවේ පියා' ලෙස සැලකෙන දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.
   (ii) 'නූතන දේශපාලනයේ පියා' ලෙස සැලකෙන දේශපාලන චින්තකයා නම් කරන්න.
   1. ....................................................................................................
   2. ....................................................................................................

2. (i) "දාර්ශනිකයින් පාලකයින් වනතුරු හෝ මේ ලෝකයේ රජවරුන්ට හා කුමාරවරුන්ට දර්ශනයේ ජීවගුණය හා බලය උකහා ගැනීමට හැකි වන තුරු රාජ්‍යයන් මුහුණ දී ඇති නරකයන්ගෙන් ඒවා නොමිදෙනු ඇත."
   (ii) "දේශපාලනය වූ කලී සටනක් වේ. දේශපාලනය වූ කලී නොනවතින බල අරගලය වේ. සෑම දේශපාලනයක්ම බල දේශපාලනය වේ."
   මෙම පාඨ දෙක උපුටා ගත් ග්‍රන්ථ **දෙක** හා ඒවායේ **කතුවරුන්** නම් කරන්න.
   1. ....................................................................................................
   2. ....................................................................................................

3. "වර්තමාන ලෝකය තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන ආණ්ඩුක්‍රම වර්ග තුනක් තිබේ." එයින් **දෙකක්** නම් කරන්න.
   1. ....................................................................................................
   2. ....................................................................................................

4. "ගුණාත්මක සාධක පදනම් කොට ගෙන දේශපාලන පක්ෂ කොටස් දෙකකට බෙදනු ලැබේ." එම කොටස් **දෙක** නම් කරන්න.
   1. ....................................................................................................
   2. ....................................................................................................

5. "සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාවට නංවන ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ." එම ක්‍රම **දෙක** නම් කරන්න.
   1. ....................................................................................................
   2. ....................................................................................................

[ දෙවෙනි පිටුව බලන්න.

6. "ජනතාව සහභාගි වන ආකාරය අනුව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවෙන ක්‍රම දෙකක් තිබේ." එම ක්‍රම **දෙක** නම් කරන්න.

1. ......................................................................

2. ......................................................................

7. "ස්වාධිපති න්‍යායේ සහ බලතල බෙදීමේ න්‍යායේ නිර්මාතෘවරුන් **දෙදෙනා** නම් කරන්න.

1. ......................................................................

2. ......................................................................

8. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා සහ කැබිනට් ආණ්ඩුක්‍රමයක අගමැති හා කැබිනට් මණ්ඩලය තනතුරුවලින් ඉවත් කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභා විසින් භාවිතයට ගන්නා විධික්‍රම **දෙක** නම් කරන්න.

1. ......................................................................

2. ......................................................................

9. "ආණ්ඩු විසින් ආණ්ඩුවේ බලය ජනතාව මත ක්‍රියාවට නංවන්නේ ප්‍රධාන උපකරණ දෙකක් භාවිත කරමිනි." එම උපකරණ **දෙක** නම් කරන්න.

1. ......................................................................

2. ......................................................................

10. "අන්තර්ජාතික සංවිධාන සමන්විත වන්නේ සංවිධාන වර්ග දෙකකින් ය." එම සංවිධාන වර්ග **දෙක නම් කරන්න.**

1. ......................................................................

2. ......................................................................

11. "කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාදායක සභාව සමන්විත වූයේ දෙවර්ගයක නියෝජිතයන්ගෙනි." එම **දෙවර්ගය** නම් කොට ඒ ඒ වර්ගයට අයත් වූ නියෝජිත සංඛ්‍යාව දක්වන්න.

1. ......................................................................

2. ......................................................................

12. "ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ අමාත්‍ය මණ්ඩලය සමන්විත වූයේ දෙවර්ගයක අමාත්‍යවරුන්ගෙනි." එම **දෙවර්ගය** නම් කොට ඒ ඒ වර්ගයට අයත් වූ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව දක්වන්න.

1. ......................................................................

2. ......................................................................

13. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ සෙනෙට් සභාවට නියෝජිතයින් පත් කළේ ක්‍රම දෙකක් අනුවය" එම ක්‍රම **දෙක** නම් කොට එක් එක් ක්‍රමය යටතේ පත්කළ නියෝජිත සංඛ්‍යාව දක්වන්න.

1. ......................................................................

2. ......................................................................

14. සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සැපයූ ආවරණ **දෙකක්** නම් කරන්න.

1. ......................................................................

2. ......................................................................

[ තුන්වෙනි පිටුව බලන්න.

15. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ඉදිරියට ගෙන ආ හැකි පනත් කෙටුම්පත් වර්ග දෙකක් වූ අතර ඒ ඒ පනත් කෙටුම්පත් වර්ගය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ක්‍රියාත්මක විය යුතු කාල වකවානු දෙකකද විය." එම පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් වර්ග **දෙක** සහ ඒ ඒ වර්ගයට වෙන් කරන ලද කාල වකවානු දක්වන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

16. අධිකරණ කටයුතු පිළිබඳව ක්‍රියා කිරීම සඳහා 1972 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථා මණ්ඩල **දෙක** නම් කොට එක් එක් මණ්ඩලයේ සංයුතිය දක්වන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

17. "1987 වර්ෂයේදී පළාත් සභා ස්ථාපිත කරනු ලැබුවේ නීතිමය ප්‍රතිපාදන දෙකක් පදනම් කොට ගෙනය." එම නීතිමය ප්‍රතිපාදන **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

18. "1978 ව්‍යවස්ථාව මගින් කරුණු දෙකක් පිළිබඳ ව තනි සහ අනන්‍ය විනිශ්චය බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා ඇත." එම කරුණු **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

19. "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැංවිය යුත්තේ දෙයාකාර ක්‍රමයකට මට්ටම් දෙකකදී ය." එම ක්‍රම **දෙක** සහ මට්ටම් **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

20. "එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවිධාන ව්‍යුහය ගොඩනගා තිබෙන්නේ ප්‍රධාන ආයතන හයක් මතය." එම ආයතන හයෙන් **දෙකක්** නම් කරන්න.

1. ..............................................................................................................

2. ..............................................................................................................

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

59112

උපදෙස්:

※ B හා C කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

1. (i) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කෙටියෙන් දක්වන්න.
   (ii) දේශපාලන විද්‍යාව, විද්‍යාවක් නොවන බවට ඉදිරිපත් වී ඇති මතය ගැන අදහස් දක්වන්න.
   (ලකුණු 10 × 2 = 20 යි.)

2. (i) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ හා,
   (ii) ෆැසිස්ට් රාජ්‍යයක් තුළ
   පුද්ගලයාගේ තත්ත්වය විමසන්න.
   (ලකුණු 10 × 2 = 20 යි.)

3. පහත දක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** ගැන අදහස් දක්වන්න.
   (i) ෆෙඩරල්වාදයේ යහපත් හා අයහපත් ලක්ෂණ
   (ii) සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ
   (iii) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ
   (iv) මානව අයිතිවාසිකම් හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධික්‍රම
   (v) යහ පාලනය
   (ලකුණු 10 × 2 = 20 යි.)

4. පහත දක්වෙන ඕනෑම **දෙකක්** විභාග කරන්න.
   (i) ජාතික දේශපාලනය හා අන්තර්ජාතික දේශපාලනය අතර වෙනස්කම්
   (ii) රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හා වැදගත්කම
   (iii) ගැටුම් කළමනාකරණය කිරීමේ විධික්‍රම
   (ලකුණු 10 × 2 = 20 යි.)

## C කොටස

5. කෝල්බෲක්-කැමරන් කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ දක්වා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රමයට ඒවායින් වූ බලපෑම විවේචනාත්මකව පරීක්ෂා කරන්න.
   (ලකුණු 20 යි.)

6. ඩොනමෝර් කොමිසම ඉදිරිපත් කළ පහත දක්වෙන යෝජනා දෙක මගින් ශ්‍රී ලංකාවේ සමාජයට වූ බලපෑම විවේචනාත්මකව විමසන්න.
   (i) සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීම
   (ii) වාර්ගික නියෝජනය අහෝසි කිරීම
   (ලකුණු 10 × 2 = 20 යි.)

7. 1948 සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ පහත දක්වෙන දේශපාලන ආයතන **දෙක** සංසන්දනය කොට වෙනස්කම් දක්වන්න.
   (i) නාමික විධායකය
   (ii) ව්‍යවස්ථාදායකය
   (ලකුණු 10 × 2 = 20 යි.)

8. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පහත දක්වෙන ඕනෑම **දෙකක්** විභාග කරන්න.
   (i) ජනාධිපති සහ කැබිනට් මණ්ඩලය
   (ii) ජනාධිපති සහ අධිකරණය
   (iii) ජනාධිපති සහ රාජ්‍ය සේවය
   (iv) ජනාධිපති සහ පළාත් සභා
   (ලකුණු 10 × 2 = 20 යි.)

* * *